# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1717/14 - 2011 අගෝස්තු 03 වැනි බදාදා - 2011.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 24/51.

**(203 අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමග කියවිය යුතු 141 වැනි, 143 වැනි, 144 වැනි, 168 වැනි සහ 190 වැනි වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග :-

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2011 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 2 දරන මෝටර් වාහන (අධිවේගී මහා මාර්ග) නියෝග යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2. මෙම නියෝග 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සියලුම අධිවේගී මහා මාර්ග සඳහා අදාළ විය යුතු ය.

3. කිසිම තැනැත්තකු විසින්, මෙම නියෝගවල උපලේඛනයේ දක්වා ඇති පන්තියකට අයත් කිසිම වාහනයක් අධිවේගී මහා මාර්ගයක ධාවනය කිරීම හෝ භාවිත කිරීම නොකළ යුතු ය.

4. කිසිම තැනැත්තකු විසින් කිසිම විශේෂ කාර්ය වාහනයක් අධිවේගී මහා මාර්ගයක ධාවනය කිරීම හෝ භාවිතා කිරීම නොකළ යුතුය.

එසේ වුව ද, අධිවේගී මහා මාර්ගයක නඩත්තුව සම්බන්ධ යම් ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවන්වල දී, යම් විශේෂ කාර්ය වාහනයක් භාවිත කිරීම සඳහා මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂ අවසරයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

1A - G 14865— 835 (2011/08)

5. කිසිම තැනැත්තකු විසින් කිසිම මෝටර් සයිකලයක් අධිවේගී මහා මාර්ගයක ධාවනය කිරීම හෝ භාවිත කිරීම නොකළ යුතු ය.

එසේ වුව ද, පොලිස්පතිවරයා විසින් හුදෙක් ම අධිවේගී මහා මාර්ගයේ මුර සංචාරය කිරීම සඳහා ස්ථාපනය කරන ලද පොලිස් කොට්ඨාස මගින් එම අධිවේගී මහා මාර්ගයේ මුර සංචාරය කිරීම සඳහා මෝටර් සයිකල් ධාවනය කිරීම හෝ භාවිතා කිරීම කරනු ලැබිය හැකිය.

6. මේ නියෝග හෝ අධිවේගී මහා මාර්ගවලට අදාළ යම් ලිඛිත නීතියක් ප්‍රකාර, අවස්ථාවෝචිත පරිදි, මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයාට, පොලිස්පතිවරයාට හෝ මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරන ලද යම් විශේෂිත ක්‍රියාකාරකමක් කරගෙන යාමේ කාර්යය සඳහා එකී මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින්, හෝ පොලිස්පතිවරයා විසින් හෝ මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙන ලද විශේෂිත අවසරයක් මත මිස, කිසිම තැනැත්තකු අධිවේගී මහා මාර්ගයකට හෝ ඒ මහා මාර්ගයක යම් කොටසකට ඇතුලු වීම හෝ භාවිත කිරීම නොකළ යුතු ය.

7. කිසිම තැනැත්තකු විසින් පැයට කිලෝමීටර් සියයක (100) වේගය ඉක්මවා අධිවේගී මහා මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය නොකළ යුතු ය.

8. පුහුණුවන්නන්ගේ අවසර පත්‍රයක් දරන යම් තැනැත්තකු විසින් 'එල් ' (L) පුවරුවක් සවිකළ යම් මෝටර් වාහනයක් අධිවේගී මහා මාර්ගය තුළ ධාවනය කිරීම හෝ භාවිත කිරීම නොකළ යුතුය.

9. අධිවේගී මහා මාර්ගය තුළ යම් ස්ථානයක යම් හදිසි අනතුරක් හෝ වාහන ක්‍රියාවිරහිත වීමක් සිදු වූ විට රියදුරු විසින් අධිවේගී මහා මාර්ගය භාවිත කරන වෙනත් තැනැත්තන්ට ප්‍රමාණවත් ලෙස දැනුම් දීමක් කිරීමේ අරමුණින් පූර්වාදාත්මක ත්‍රිකෝණකාර උපකරණය සහ අනතුරු ඇඟවීමේ ලාම්පු ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය වන්නේ ය.

10. යම් රියැදුරකු විසින්, වාහනයට අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකයේ දක්වා ඇති උපරිම තාර බර හෝ දළ වාහනයේ බර ඉක්මවා භාවිත කරනු ලබන්නේ නම්, ඒ රියදුරු විසින් ඒ වාහනය යම් අධිවේගී මහා මාර්ගයකට හෝ මහා මාර්ගයක කොටසකට ඇතුලු කිරීම හෝ ඒ මාර්ගයක භාවිත කිරීම නොකළ යුතුය.

11. කිසිම රියැදුරකු විසින් මෝටර් වාහන පනත යටතේ වන නියෝගවල නිශ්චිතව සඳහන් කර ඇති මානවල උපරිම සීමාවන් ඉක්මවා කිසිදු අධිවේගී මහ මාර්ගයකට ඇතුලු වීම හෝ භාවිත කිරීම නොකළ යුතුය.

12. අධිවේගී මහා මාර්ගයකට ඇතුලු වූ කිසිම තැනැත්තකු 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 83 වැනි වගන්තිය ප්‍රකාර ඒ අධිවේගී මහා මාර්ගයේ වාහන නවතා තැබීමේ ස්ථානයක් නොවන ස්ථානයක තමා විසින් ධාවනය කරනු ලබන වාහනය ගාල් කර තැබීම හෝ නවතා තැබීම නොකළ යුතු අතර ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්ය සඳහා ඒ පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

13. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකරු වන්නේ ය.

(3 වැනි නියෝගය)

**උපලේඛනය**

1. මෝටර් ට්‍රයිසිකල්
2. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ
3. කෘෂි කාර්මික ඉඩම් වාහන
4. අත් ට්‍රැක්ටර්
5. ආබාධිතයන් සඳහා වූ රථ
6. වාෂ්ප බලයෙන් ධාවනය කෙරෙන මෝටර් වාහන

08-457

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.